මාධ්‍ය නිවේදන අංක 25

**මැතිවරණ කොමිෂන් සභාව**

**2021.10.22 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.**

- සමහර පළාත් පාලන ආයතන නියෝජිතයින්ගේ හැසිරීම්/ක්‍රියාකලාප තුළින් මෙරට ක්‍රියාත්මක වන නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳවත්, මහජන ඡන්දයෙන් තෝරාපත් කර ගනු ලබන ජනතා නියෝජිතයන් පිළිබඳවත් සහ එම ආයතනවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ද ජනතාව තුළ පවත්නා විශ්වාසය බිඳවැටෙමින් පවතී. මෙවැනි සිදුවීම් පිළිබඳ විමර්ශනය කොට එම සිද්ධීන්වලට වැරදිකරුවන් වන නියෝජිතයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම ජනතා අවශ්‍යතාවක්ව පවතින බව ඔවුන් නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගේ අවධානය යොමුකරමින් හා ඒ සම්බන්ධ සුදුසු විනය ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා ලෙසට ඉල්ලා සිටීම ද මෙවැනි විෂමාචාර ක්‍රියාකාරකම් සිදුකරනු ලබන මහජන නියෝජිතයන්ට එරෙහිව ආණ්ඩුකාරවරුන්ගේ බලතල ප්‍රකාරව සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම කළයුතුව පවතින්නක් බව මැතිවරණ කොමිෂන් සභාවේ අදහස බව පළාත් ආණ්ඩුකාරවරුන් වෙත දන්වා යැවීම.
- 2021 වර්ෂයේ කෙටුම්පත් ඡන්දහිමි නාමලේඛනයේ එනම්, 2020 ඡන්දහිමි නාමලේඛනයෙන් ඉවත් කරනු ලැබූ නම් සහ අළුතින් ඇතුළත් කරනු ලැබූ නම් ඇතුළත් 2021.10.21 දිනට ප්‍රතිශොධිත 2021 ඡන්දහිමි කෙටුම්පත් නාමලේඛනයේ පිටපතක් බැගින් අය කිරීමකින් තොරව පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන සියළුම දේශපාලන පක්ෂ වෙත ලබාදීම.
- 2021 ඔක්තෝබර් 13 දින සහතික කළ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම් පනතේ සංශෝධන ප්‍රකාරව වයස අවුරුදු 18 සම්පූර්ණ වන යෞවන යෞවනියන් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධව පුළුල් දැනුම්වත් කිරීම් සිදුකිරීම හා ඒ පිළිබඳව අදාළ පාර්ශව සමඟ වැඩමුළු සංවිධානය කිරීම.
- මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා ඡන්ද විමසීම් ක්‍රියාවලිය සම්බන්ධව ධාරිතාවර්ධන පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021.10.22